ශීර්ෂය - 426 කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

------------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අගෝස්තු 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ ලෙස රු.27,338,987 ක් දක්වා ඇති නමුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ 6) වත්කම්වල මුළු එකතුව රු.13,735,847 ක් වූයෙන් රු.13,603,139 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA 6 ) හි වත්කම්වල එකතුව රු.13,735,847 ක් වුවත් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.27,338,987 ක් ලෙස අතපසු වීමකින් සටහන්ව ඇත. රු.13,603,139 ක වෙනස නිවරදි කිරීමට පියවර ගනිමි. | වෙනස නිවරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ජාතික පොහොර කළමනාකරණ පද්ධතිය සැකසීමේදී පුවත් පත් දැන්වීමක් සඳහා දරන ලද රු.132,710 ක වියදමක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කම් ලෙස දැක්වීම නිසා මූල්‍ය නොවන වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ජාතික පොහොර කළමනාකරණ පද්ධතිය සැකසීම වෙනුවෙන් දරන ලද පුවත්පත් දැන්වීම සඳහා වියදම රු.132,710 කළමනාකරණ පද්ධතිය සැකසීම වෙනුවෙන්ම දරන ලද නිසා අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම් ගත කර ඇත. | වියදම නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

### 1.6.2 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව රු.5,852,092 ක් පෙන්නුම් කර ඇතත් එදිනට අමාත්‍යාංශ පොත් අනුව කිසිදු ශේෂයක් දක්වා | අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව රු.5,852,092 ක් ශේෂයක් පෙන්නුම් කර ඇත. | වර්ෂාවසාන අග්‍රිම ගිණුම් ශේෂය නියමිත දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| නොතිබුණි. මෙයට හේතුව එම ප්‍රකාශයේ පැහැදිලි කර නොතිබුණි. | අමාත්‍යාංශයේ පොත් අනුව ශේෂයක් නොපෙන් විමට හේතුව වන්නේ එම ශේෂය භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීමයි. එම ශේෂය භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද්දේ 2022 ජනවාරි 03 වන දින දීය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම රු. | <br>අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 396 | 276,063 | කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වටිනාකම රු.276,063 වූ කල් ඉකුත් වූ චෙක්පත් අතරින් රු.2,260 වටිනා චෙක්පත මේ වන විට උපලබ්ධිවී ඇත. තවදුරටත් උපලබ්ධි විමට ඇති චෙක්පත් වටිනාකම රු.273,802.64 කි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 756(6) | | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ සමීක්ෂණය නිමකර වාර්තාව 2022-02-20 දින ඉදිරිපත් කර ඇත. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 1646 | වාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් හා ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2021 වර්ෂය අදාළව අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ භාවිතා කරන ලද වාහන 22 කට අදාළව ධාවන සටහන් හා මාසික සාරාංශ 2022 අප්‍රේල් 07 දින වන විටත් විගණනයට ඉදිරිපත්කරනො තිබුණි. | 2021 වර්ෂයට අදාළ සියලුම ධාවන සටහන් භාරදී ඇති අතර ඉදිරියේදි මාසයට අදාළ ධාවන සටහන් ඊළග මස 15 දිනට පෙර භාරදීමට කටයුතු කිරීමට ප්‍රවාහන අංශය දැනුවත් කරන ලදී. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ෙ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයට වෙන්කර තිබුණු රු.35,554,150,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.13,926,785,924 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණු අතර එහි ප්‍රතිශතය සියයට 39 කි. | Covid 19 තත්වය මත අත්‍යවශ්‍ය සේවාවන් පමණක් සිදු කිරීම හා අංක 2235/45 හා 2021/07/07 දිනැති ගැසට් පත්‍රය මගින් වැය ශීර්ෂ 425/426 ඒකාබද්ධ කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු අතර සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අත්‍යාවශ්‍යයෙන්ම දැරිය යුතු වැය විෂයයන් හඳුනාගෙන ප්‍රතිපාදන සලසා නොගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 06 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක එකතුව රු.11,885,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | covid 19 නිසා විදේශිය ගමන් සීමා විම, නව අමාත්‍යාංශයක් බැවින් නව යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ භාවිත වීම නිසා අලුත් වැඩියා ඇති නොවිම,අංක 2235/45 හා 2021/07/07 දිනැති ගැසට් පත්‍රය මගින් වැය ශීර්ෂ 425/426 ඒකාබද්ධ කිරිම නිසා ඉතිරි වීම් පොහොර රාජ්‍ය අමාත්‍යාංශය භාවිත කරනු ලබන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල බැවින් එම අමාත්‍යාංශයෙන් බිල්පත් ඉදිරිපත් නොවිම. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු අතර සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක හා පුනරාවර්තන වැය විෂයයන් 20 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11ක සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උක්ත ප්‍රාග්ධන හා පුනරාවර්ත වැය විෂයයන් සඳහා අනුමත වී තිබුණු රු.35,503,495,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.13,912,863,724 ක් එනම් සියයට 39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | අංක 2235/45 හා 2021/07/07 දිනැති පත්‍රය මගින් වැය ශිර්ෂ 425/426 ඒකාබද්ධ කිරිම නිසා ඉතිරි විම්, පුරප්පාඩු නොපිර වීම,<br>covid 19 තත්ත්වය හේතුවෙන් අතිකාල සේවයේ නොයේද වීම, පුරප්පාඩු නොපිර වීම, ස්ථිර කනිෂ්ඨ කාර්යමණ්ඩලය නොමැති වීම, අලුත් වැඩියා ඇති නොවීම, බිල්පත් ඉදිරිපත් නොවීම, covid 19 තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු අතර සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ දුර්වලතා

----------------------------

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ----------------------------- | -------------- |
| (අ) | විෂයාංක 42601 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ උපරිම හර ශේෂ සීමාව රු.20,000,000 ක්වූ නමුත් එහි උපරිම හර ශේෂය | උපරිම හර ශේෂය නිර්මාණය වී ඇත්තේ පහත පරිදි වේ. | අනුමත සීමා ඉක්මවීම් සිදු නොවන ලෙස රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදු කළ යුතුය. |

<table>
<tr>
<td></td>
<td>රු.24,602,727 ක් වූයෙන් අනුමත සීමාව ඉක්මවූ රු.4,602,727 ක ශේෂයක් නිරීක්ෂණය විය.</td>
<td><table><tr><td></td><td>රු.</td></tr><tr><td>මුදල් මගින් 11</td><td>4,373,912.00</td></tr><tr><td>හරස් සටහන් මගින් 12</td><td>20,228,815.00</td></tr><tr><td></td><td>24,602,727.00</td></tr></table>ඒ අනුව සත්‍ය වශයෙන් මුදලින් ණය ගෙවීම් කර ඇත්තේ රු. 4,373,912.00 ක් පමණි. අමාත්‍යාංශ අමාත්‍යාංශ අතර දෙපාර්තමේන්තු අමාත්‍යාංශ අතර ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ හරස් සටහන් මගින් පියවන ලද වටිනාකම රු.20,228,815 ක් වේ.</td>
<td></td>
</tr>
<tr>
<td>(ආ)</td>
<td>අමාත්‍යාංශයේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය හා කේවල ශේෂ ලැස්තුව අනුව අත්තිකාරම් ශේෂ අතර රු.213,021ක වෙනසක් නිරීක්ෂණය වන අතර උක්ත වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු නොකොට වැරදි බැරකිරීම් ලෙස සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර ගිණුම් සකස් කර තිබුණි.</td>
<td>නොසැසදුනු අත්තිකාරම් ශේෂය ලෙස දක්වා තිබූ රු.213,021 ක මුදල හඳුනාගෙන එම මුදල නිරවුල් කර ඇත.තවදුරටත් නිරවුල් කිරීමට ඇති ශේෂය රු.9243.87 2022 අගෝස්තු මස දී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි.</td>
<td>වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.</td>
</tr>
</table>

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 217 ක්ද, සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක්ද, | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලා වරින්වර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ලිපි යවා ඇත. අවසාන ලිපිය 2022.03.25 දින යවා ඇත. ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා අවශ්‍යතාවය බහු කාර්ය | පුරප්පාඩුව තනතුරුවලට අදාළව සේවක බඳවා ගැනීම් සිදු කළ යුතුය. තනතුරු අවශ්‍ය නොවන්නේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කළ යුතුය. |

| | |
|---|---|
| පුරප්පාඩුව පැවතියද, එම තනතුරුවලට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සංවර්ධන දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇත. (2021 දෙසැම්බර්) කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ අවශ්‍යතාව PACIS මෘදුකාංගය ඔස්සේ 2022.03.02 යාවත්කාලීන කර ඉල්ලීම් කර ඇත. සංවර්ධන නිලධාරී අවශ්‍යතාව මෙම වර්ෂයේ ආරම්භයේ දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. |